# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2143/32 - 2019 ඔක්තෝබර් මස 02 වැනි බදාදා - 2019.10.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය :* THI/LND/L2/ACQVI/140.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

මාතර දිස්ත්‍රික්කයේ තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 333 උඩුව නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අදලෙද්දුව ගමේ පිහිටි සර්වේ ජනරාල් වෙනුවෙන් මාතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක මාර 2814 හා 2019.09.03 දිනැති සැලැස්මේ කැබලි අංක 1 ලෙස පෙන්නුම් කර ඇති මුළු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4821ක් වූ පහත දැක්වෙන ඉඩම් කොටස

**කැබලි අංක 1**

ඉඩමේ නම: මානිගේවත්ත *හෙවත්* මානගේවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක්, වැසිකිළියක කොටසක්, සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් සහ අවු. 50-60 පමණ වයසැති කොස්, පොල් සහිත මිශ්‍ර වගාවක් ඇත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4821.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2019 නොවැම්බර් මස 28 වැනි දින පෙ. ව. 10.00 ට තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2019 නොවැම්බර් මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය.

උමේෂා සුරංගි මාතරගේ,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
තිහගොඩ.

2019 සැප්තැම්බර් මස 30 වැනි දින,<br>
තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10– 569



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*